# ව්‍යාපාර අධ්‍යනය

# 07 වන පාඩම

## මුදල්, බැංකු හා මූල්‍ය පද්ධතිය

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

# මුදල්

භාණ්ඩ හා සේවා හුවමාරුවේ දී පොදුවේ පිළිගනු ලබන ඕනෑ ම දෙයක් මුදල් වශයෙන් සලකයි.

**හුවමාරුව සඳහා මුදලේ අවශ්‍යතාව පහත පරිදි පෙන්වා දිය හැකි ය.**

- අතීතයේ මුදල් නොමැතිව සිදු වූ සෘජු හුවමාරුව භාණ්ඩ හුවමාරුව නම් විය.
- භාණ්ඩ හුවමාරුවේ දී විවිධ දුෂ්කරතා පැවතිණි.
- එබැවින් භාණ්ඩ හුවමාරුව වෙනුවට සෑම දෙනාම පිළිගන්නා පොදු මාධ්‍යයක අවශ්‍යතාව දැණුනි.
- එම හුවමාරු මාධ්‍ය මුදල් ලෙස හැඳින්විය.
- ඒ අනුව හුවමාරුව සඳහා මුදල් අවශ්‍ය බව පැහැදිලි වේ.

## මුදලේ කාර්යයන් පහත පරිදි දැක්විය හැකිය.

- **විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම (A medium of exchange)**

- **වටිනාකම මැනීමේ මිනුම් දණ්ඩක් ලෙස කටයුතු කිරීම (standard of value)**

- **වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම (store of value)**

- **විලම්බිත ගෙවුම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම (Defferred payments)**

## විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම

භාණ්ඩ හා සේවා හුවමාරුවේ දී අතරමැදියෙකු වශයෙන් කටයුතු කිරීමයි. නැතහොත් භාණ්ඩ හා සේවාවල මිල ගෙවනුයේ මුදල් මගිනි.

නිදසුන් ෑ රු. 30,000 ක ජංගම දුරකථනයක් මිල දී ගැනීම

## වටිනාකම මැනීමේ මිනුම් දණ්ඩක් ලෙස කටයුතු කිරීම

භාණ්ඩ හා සේවාවන්හි වටිනාකම හෙවත් අගය මැනීම සඳහා මුදල් භාවිත කිරීමයි. මෙය මිල ( **price**) නම් වේ. මෙ මගින් ගිණුම් තැබීම පහසු වී ඇති නිසා මෙය ගිණුම් ඒකකයක් ( **unit of Account**) ලෙස ද හඳුන්වයි.

නිදසුන් ෑ සපත්තු ජෝඩුවක් රු. 1999.90 ක් ලෙස මිල කිරීම

## වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම

මුදල් රැස්කර තබා ගත හැකිය.  කාසි හා නෝට්ටු යල්පැනීමකින් තොරව ක්ෂය වීමකින්  තොරව රැස්කර තබා ගනිමින් අනාගතයේ දි භාණ්ඩ හා සේවා මිලට ගැනීමට භාවිත කළ හැකි ය.

නිදසුන් : රු. 10,000 ක මුදලක් ඉතිරි කිරීම

## විලම්බිත ගෙවුම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම

අනාගත මුදල් ගෙවීමක් සඳහා වර්තමානයේ ගිවිස ගත හැකි ය. එනම් ඉදිරි දිනයක දී මුදල් ගෙවීමේ කොන්දේසි යටතේ භාණ්ඩ හා සේවා මිල දී ගත හැකි විමයි.

නිදසුන් :  2016 ජනවාරි මස රු.5000 කට මිලට ගත් භාණ්ඩ තොගයක් සඳහා 2016 මාර්තු මස මුදල් ගෙවීමට ගිවිස ගැනීම.

# හොඳ මුදලක ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- පොදු පිළිගැනීමක් තිබීම
- කල්පැවැත්මක් තිබීම
- අනුකරණයේ දුෂ්කරතාව
- පහසුවෙන් ගෙන යා හැකි වීම
- පහසුවෙන් හඳුනාගත හැකි වීම හෙවත් සමජාතීය බව
- කුඩා කොටස්වලට බෙදිය හැකි වීම

## පහත දැක්වෙන පරිදි මුදල් වර්ග කළ හැකි ය.

## ව්‍යවහාර මුදල් ( currency)

මූල්‍ය අධිකාරියේ නියෝග මත නිකුත් කරන කාසි හා නෝට්ටු මෙලෙස හදුන්වයි. ව්‍යවහාර මුදල් වලංගු මුදල් ලෙසද හඳුන්වන අතර මේවායේ ද්‍රවශීලතාව 100% කි.

නිදසුන් : කාසි හා නෝට්ටු

## බැංකු මුදල් (Bank Money)

වාණිජ බැංකු පවත්වා ගෙන යන ඉල්ලුම් තැන්පතු හෙවත් ජංගම ගිණුම්වල ශේෂ බැංකු මුදල් වේ. මෙම මුදල් ගෙවීම් කටයුතු කරන්නේ චෙක්පත් හරහා ය. ව්‍යවහාර මුදල් මෙන් ද්‍රවශීලතාව 100% ක් ම නැතත් ආසන්න මුදල්වලට වඩා ද්‍රවශීලතාවෙන් යුක්ත වේ.

නිදසුන් : වාණිජ බැංකුවල ඇති ජංගම ගිණුම් තැන්පතු

## ආසන්න මුදල් (Near Money)

ව්‍යවහාර මුදල් මෙන් 100% ක් ද්‍රවශීලතාවෙන් යුක්ත නොවූ එහෙත් වටිනාකමේ සන්නිධියක කාර්ය ඉටු කරනු ලබන පහසුවෙන් මුදල් බවට පත් කළ හැකි වත්කම්ය.

නිදසුන් : වාණිජ බැංකුවල ඇති මහජනයා සතු කාලීන හා ඉතුරුම් තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් , වාණිජ පත්‍රිකා

## විද්‍යුත් මුදල් (E-money)

තොරතුරු හා ඩිජිටල් තාක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස බිහි වී ඇති දේශීය මෙන් ම ජාත්‍යන්තර ගනුදෙනුවල දී ද ගෙවීම් කිරීමට යොදා ගනු ලබන මුදල් ය.

නිදසුන් :

හර කාඩ්පත් (debit card)

ගෙවනු ලබන මුදල් ප්‍රමාණය විද්‍යුත් ලෙස ගිණුමට හර වන, බැංකු ගිණුමේ මුදල් තිබෙන අයට පමණක් ලබා ගත හැකි කාඩ්පත්ය

## ණය කාඩ්පත් (credit card )

බැංකු ගිණුමක් නො මැති වුව ද ණය වශයෙන් භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා මෙන්ම මුදල් ලබා ගැනීම සඳහා ද භාවිත කරන කාඩ්පත් විශේෂයකි.

## පෙර ගෙවුම් කාඩ්පත් (prepaid card )

කලින් මුදල් ගෙවා ලබා ගත හැකි කාඩ්පත්ය

**මෙම කාඩ්පත් මගින් ගෙවීම් කිරීම පහසු කිරීම සඳහා පහත සේවාවන් (පහසුකම්) යොදා ගනී.**

- ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර -(ATM යන්ත්‍ර - **Automatic Teller Machines)**
- ස්වයංක්‍රීය තැන්පතු යන්ත්‍ර ( ADM යන්ත්‍ර - **Automatic Deposits Machines )**
- චෙක්පත් තැන්පතු යන්ත්‍ර ( CDM යන්ත්‍ර - **Cheques Deposits Machines )**
- වෙළෙඳසැල් ගෙවීම් විද්‍යුත් පැවරුම් ජාල - **( Electronic funds transfer point of sales )**
- ටෙලි බැංකු පහසුකම් - **Tele banking**
- අන්තර්ජාල බැංකු කටයුතු - **Internet banking / Online banking**
- ටෙලිවිෂන් බැංකු පහසුකම් - **Televission banking**

# ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන පහත සඳහන් ආකාරයට වර්ග කරයි

## බැංකු අංශය

- ශ්‍රී ලංකා මහ බැංකුව
- බලපත්‍රලාභී වාණිජ බැංකු
- බලපත්‍රලාභී විශේෂිත බැංකු

## තැන්පතු භාරගන්නා අනෙකුත් මූල්‍ය ආයතන

- බලපත්‍රලාභී මුදල් සමාගම්
- සමුපකාර ග්‍රාමීය බැංකු
- සකසුරුවම් හා ණය ගනුදෙනු සමූපකාර සමිති

## විශේෂිත මූල්‍ය ආයතන

- විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්
- ප්‍රාථමික අලෙවිකරුවන්
- කොටස් තැරැව්කරුවන්
- ඒකක භාර/ ඒකක භාර කළමනාකරණ සමාගම්
- වෙළෙඳපොළ අතරමැදියන්
- ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්

## ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන

- රක්ෂණ සමාගම්
- සේවක අර්ථසාධක අරමුදල
- සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල
- අනුමත විශ්‍රාම හා අර්සාධක අරමුදල්
- රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල්

## ශ්‍රී ලංකා මහ බැංකුව (Central Bank of Sri Lanka )

ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ නියෝජිතයකු ලෙස ක්‍රියා කරන කේන්ද්‍රීය ආයතනය ශ්‍රී ලංකා මහ බැංකුවයි

## බලපත්‍රලාභී වාණිජ බැංකු ( Licensed Commercial Banks )

ජංගම ගිණුම් ඇතුළු අනෙකුත් තැන්පත් ගිණුම් පවත්වා ගෙන යාම හා මුදල් මැවීමට හැකියාව ඇති මූල්‍ය ආයතන විශේෂයයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ හා මුදල් මණ්ඩලයේ ලියාපදිංචි බලපත්‍රලාභී වාණිජ බැංකු රාශියක් ඇති අතර මේවායින් කිහිපයක් රාජ්‍ය අංශයට ද බහුතරයක් පෞද්ගලික අංශයට ද අයත් වේ.

නිදසුන් : රාජ්‍ය අංශයේ වාණිජ බැංකු - ලංකා බැංකුව මහජන බැංකුව පෞද්ගලික අංශයේ වාණිජ බැංකු - සම්පත් බැංකුව, කොමර්ෂල් බැංකුව, හැටන් නැෂනල් බැංකුව, සෙලාන් බැංකුව

# බලපත්‍රලාභී විශේෂිත බැංකු ( Licensed Specialized Banks)

බැංකු පනත යටතේ විශේෂිත බැංකුවක් ලෙස ව්‍යාපාර කටයුතු කර ගෙන යාමට මහ බැංකුවෙන් බලපත්‍රයක් ලබා ගෙන ඇති ආයතන විශේෂයකි. මෙහි ඇති විශේෂත්වය නම් ජංගම ගිණුම් පවත්වා ගෙන යාමට අවසර නොමැති වීමයි.

එහෙත් ඉතිරි කිරීමේ ගිණුම් හා කාලීන තැන්පත් ගිණුම් වශයෙන් මහජනතාවගෙන් මුදල් තැන්පත් භාර ගැනීමට අවසර ඇත

නිදසුන් : ජාතික ඉතිරි කිරීමේ බැංකුව ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව ප්‍රාදේශීය සංවර්ධන බැංකුව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

## බලපත්‍රලාභී විශේෂිත බැංකු ව්‍යාපාරවල ක්‍රියාකාරීත්වයට දායක වන ආකාරය

-  කාලීන හා ඉතිරි කිරීමේ තැන්පත් භාර ගැනීම
-  විවිධ ක්ෂේත්‍රවල ව්‍යවසායකයින්ට ණය සැපයීම
-  සමාගම්වල කොටස් ප්‍රාරක්ෂණ කටයුතු කිරීම
-  කල්බදු පහසුකම් සැපයීම
-  කළමනාකරණ උපදේශන සේවා සැපයීම

# බලපත්‍රලාභී මුදල් සමාගම් (Finance Companies )

කාලීන තැන්පතු භාර ගැනීම හා එම මුදල් මත ණය දීම සහ ආයෝජනයට පහසුකම් සලසන, මුදල් නීති පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවෙන් බලපත්‍රයක් ලබා ගෙන ඇති පොදු සමාගම් විශේෂයකි

නිදසුන් :

එල්.බී. ෆිනෑන්ස් පී.එල්.සී

සිංහ පුත්‍ර ෆිනෑන්ස් පී.එල්.සී.

සිංගර් ෆිනෑන්ස් පී.එල්.සී

# බලපත්‍රලාභී මුදල් සමාගම්වල කාර්යයන් කිහිපයක් පහත දැක්වේ

- කුලීපිට ගැනුම් පහසුකම් සැපයීම
- දේපළ හා ඉඩම් වෙළෙඳාම් කිරීම
- කල්බදු මූල්‍යකරණය
- කෙටිකාලීන ණය සැපයීම
- රජයේ සුරැකුම්පත්වල ආයෝජනය
- කාලීන තැන්පතු භාර ගැනීම

# සමුපකාර ග්‍රාමීය බැංකු (Co-operative Rural Banks)

සාමාජික හා සාමාජික නො වන්නන්ගෙන් කාලීන හා ස්ථාවර තැන්පත් ලබා ගැනීම සහ සිය සාමාජිකයින්ට ණය සැපයීම ප්‍රධාන කාර්යය කොටගත් ආයතනයකි. මෙය විවිධ සේවා සමුපකාර සමිතිවල බැංකු ව්‍යාපාරික අංශයය.

නිදසුන් : මහරගම විවිධ සේවා සමුපකාර සමිතියේ සමුපකාර ග්‍රාමීය බැංකුව

# සමුපකාර ග්‍රාමීය බැංකුවල කාර්යයන්

-  සාමාජික හා සාමාජික නො වන්නන්ගෙන් තැන්පත් ලබා ගැනීම
-  උකස් කටයුතු කිරීම
-  ඉතිරි කිරීමේ හා ස්ථාවර තැන්පත් ගිණුම් පවත්වා ගැනීම
-  සාමාජිකයින්ට කෘෂිකර්මය, නිෂ්පාදනය, කර්මාන්ත හා අලෙවි කටයුතු සඳහා ණය පහසුකම් සැලසීම
-  සමුපකාර ජීවන ක්‍රමය ගැමි ජනතාව අතර ප්‍රචලිත කිරීම

# සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපකාර සමිතිය (සණස)

ඉතිරි කිරීම් දිරිමත් කිරීමත්, සාමාජිකයින්ට ණය සැපයීමත් අරමුණු කර ගෙන සාමාජිකයින්ගේ ඉතුරුම් ලෙස හා සාමාජික කොටස් ලෙස මුදල් ලබා ගෙන සාමාජිකයින්ට පමණක් ණය සපයන, සමුපකාර පනත යටතේ සමුපකාර කොමසාරිස් වෙත ලියාපදිංචි කළ යුතු ආයතන විශේෂයකි.

නිදසුන් : නෙලුම්කුළම සණස සමිතිය   අත්තනගල්ල සණස සමිතිය

# සණස සමිති පහත කාර්යයන් ඉටු කරයි

- සාමාජිකයින්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අලෙවි මධ්‍යස්ථාන පවත්වා ගෙන යාම
- සමිතිය නියැලි ක්ෂේත්‍රයේ උපකරණ සහන මිලට අලෙවි කිරීම

නිදසුන් : ධීවර සමුපකාර සමිති ධීවර ආම්පන්න අලෙවි කිරීම

- තැන්පත් භාර ගැනීම හා සාමාජිකයින්ට ණය සැපයීම

# විශේෂිත මූල්‍ය ආයතන

## විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් (Special Leasing Companies)

කල්බදුකරණය සඳහාම මහ බැංකුවේ ලියාපදිංචි වූ සමාගම් විශේෂයකි. ව්‍යාපාරිකයින්ට අවශ්‍ය යන්ත්‍රෝපකරණ හා වෙනත් වත්කම් පාවිච්චි කිරීම පිණිස ව්‍යාපාරිකයින්ගේ ඉල්ලීම පරිදි බද්දට ගැනීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීම ප්‍රධාන ව්‍යාපාරික කටයුත්ත කරගත් මූල්‍ය ආයතන විශේෂයකි. අදාළ වත්කම් බද්දට දීමෙන් ලැබෙන කුලී ආදායම මෙම ආයතනවල ප්‍රධාන ආදායම වේ.

නිදසුන් : ඇසෙට්ලයින් ලීසිං කම්පැනි ලිමිටඩ් එල්ඕඑල්සී මයික්‍රෝ ක්‍රෙඩිට් ලිමිටඩ් එස්.එම්.බී.ලීසිං පීඑල්සී ඉසුරු ලීසිං කම්පැනි ලිමිටඩ්

# කල්බදු සමාගම් මගින් ව්‍යාපාරිකයෙකුට අත්වන වාසි

- විශාල වටිනාකමකින් යුත් වත්කම්, මුළු මුදලම නොගෙවා භාවිතයට ඉඩකඩ ලැබීම
- කල්බදු සඳහා ගෙවන කුලිය ආදායම් බද්දෙන් නිදහස් වීම
- යන්ත්‍ර යල්පැනීම නිසා සිදු වන පාඩු හා ප්‍රාග්ධන අලාභ මගහැරීම
- විශාල මුදලක් ආයෝජනය නොකර වැඩි ආදායමක් ඉපැයීමේ හැකියාව

# ප්‍රාථමික අලෙවිකරුවන් (Primary Dealers)

රජයේ සුරැකුම්පත් ප්‍රථම වතාවට අලෙවි කොට මුදල් ලබා ගන්නා වෙළෙඳපොළ ප්‍රාථමික වෙළෙඳපොළයි. මෙම ප්‍රාථමික වෙළෙඳපොළට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර ලබා දී ඇති ආයතන ප්‍රාථමික අලෙවිකරුවන් ලෙස හැඳින්වේ.

ප්‍රාථමික අලෙවිකරුවන්ගේ මූලික කාර්යභාරය වන්නේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ප්‍රාථමික වෙන්දේසිවලට සහභාගී වීමත්, භාණ්ඩාගාර සුකුම්පත් සම්බන්ධයෙන් ද්විතීයික වෙළෙඳපොළේ ගනුදෙනු කිරීමත්ය

නිදසුන් : කැපිටල් එලායන්ස් සමාගම සෙලින්කෝ ශ්‍රීරාම් සුරැකුම්පත් සමාගම ලංකා බැංකුව සම්පත් සුරැකුම්පත් සමාගම

# කොටස් තැරැව්කාර සමාගම් (Share Brokers)

සංස්ථාපිත සමාගම්වල කොටස් හෝ ණයකර විකිණීම හා මිලට ගැනීම සම්බන්ධ කටයුතු කිරීමට අතරමැදියන් ලෙස කටයුතු කරන ආයතන තැරැව්කාර සමාගම් ලෙස හැඳින්වේ.

කොටස් තැරැව්කරුවන් ලෙස ව්‍යාපාරික කටයුතු කිරීම සඳහා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවෙන් බලපත්‍රයක් ලබා ගත යුතුය.

නිදසුන් : ආශා පීපල්ස් සුරැකුම්පත් සමාගම ඒෂියා සුරැකුම්පත් (පෞද්ගලික) සමාගම ජෝන් කීල්ස් කොටස් තැරැව්කාර (පෞද්ගලික) සමාගම ජේ.බී. සෙකියුරිටීස් (පෞද්ගලික) සමාගම

# කොටස් තැරැව්කාර සමාගම්වල කාර්යයන්

- ආයෝජකයින්ගේ ගැනුම් ඇණවුම් හා විකුණුම් ඇණවුම් භාර ගැනීම
- ආයෝජකයින් වෙනුවෙන් මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගිණුම් විවෘත කිරීම
- කොටස් හා ණයකරවල ආයෝජනය සම්බන්ධ උපදෙස් ආයෝජකයින්ට සැපයීම
- කොටස් වෙළෙඳපොළ විශ්ලේෂණය කිරීම හා වෙළෙඳපොළ සමීක්ෂණ වාර්තා සැකසිම මගින් ආයෝජකයින්ගේ ප්‍රතිලාභ උපරිම කිරීම සහතික කිරීම
- සමාගම් ලැයිස්තුගත කිරීමට අනුග්‍රහය දැක්වීම
- සිමාසහිත පොදු සමාගම්වලට ප්‍රාග්ධන සම්පාදනය සඳහා සහාය වීම

# ඒකක භාර /ඒකකභාර කළමනාකරණ සමාගම් (Unit Trust / Unit Trust Management Companies)

ඒකක භාරයක් යනු ආයෝජකයින්ට ඒකක (Unit) විකිණීමෙන් රැස්කර ගන්නා මුදල්වලින් සමන්විත ආයෝජන අරමුදලකි. මෙහි රැස් කර ගත් මුදල් වෘත්තීය අරමුදල් කළමනාකරුවන් විසින් ආයෝජන් කළඹක යොදවනු ලැබේ. එහි ප්‍රතිලාභ ඒකක භාරයේ ඒකක මිල දී ගත් ආයෝජකයින් අතරේ බෙදා හරිනු ලැබේ.

ඒකක භාරයක් පාර්ශ්ව තුනකින් සමන්විත වේ.

1. ඒකක භාරකරු
2. අරමුදල් කළමනාකරණ සමාගම
3. ඒකක හිමියන් හෙවත් ආයෝජකයින්

නිදසුන් :

## අරමුදල් කළමනාකරණ සමාගම

නැෂනල්  වත්කම් කළමනාකරණ සමාගම

ද යුනිට්ට්‍රස්ට් කළමනාකරණ (පෞද්.)සමාගම

සිලෝන් වත්කම් මැනේජ්මන්ට් සමාගම

## ඒකක භාරකරු

නාමල් ඒකක භාරය

සී බැන්ක් ඒකක භාරය

සිලෝන් ඉතුරුම් අරමුදල

## ඒකක භාරවල ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ

-  විවිධාංගීකරණය වූ ආයෝජනවල මුදල් යෙදවීම නිසා අවදානම අඩු වීම
-  ආයෝජන කළමනාකරණය සඳහා වෘත්තීය කළමනාකරුවන්ගේ සේවය ලබා ගත හැකි වීම

## වෙළෙඳපොළ අතරමැදියන් : (Market Intermidieries)

ප්‍රාරක්ෂකයින් , ආයෝජන කළමනාකරුවන් සහ ආන්තික සැපයුම්කරුවන් මෙයට ඇතුළත් වන අතර මූල්‍ය උපකරණ වෙළෙඳාම් කිරීමේ අතරමැදියන් ලෙස මොවුන් කටයුතු කරයි.

මූල්‍ය උපකරණ විකුණා දීමේ සේවය සඳහා සේවා ගාස්තු, මිල දී ගන්නන්ගෙන් සහ විකුණන්නන්ගෙන් අයකර ගනී

# ප්‍රාරක්ෂකයන් (Underwriters)

සමාගමක් මහජනයාට කරනු ලබන සුරැකුම් නිකුතුවක දී නියමිත කාලය තුළ සැලසුම් කළ අරමුදල් ප්‍රමාණය සපයා ගත නො හැකි වූ විට

ආයෝජකයින් විසින් මිලදී නොගෙන ඉතිරි වූ සුරැකුම් මිල දී ගැනීමට ගිවිස ගන්නා ආයතනයි. ආයෝජන කළමනාකරුවන් යනු මහජනයාට කරනු ලබන

**සුරැකුම් නිකුතුවක දී ඒ සඳහා විවිධ සේවා සපයන ආයතන ය. එම ආයතන සපයන සේවා නම්,**

- නිකුතුව පිළිබඳ ආයෝජන ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීම
- ආයෝජන ඉල්ලුම් පත්‍ර භාර ගැනීම
- ආයෝජකයින්ට සුරැකුම් බෙදා දීම
- නිකුතුව පිළිබඳ මුදල් කළමනාකරණය
- ප්‍රචාරක කටයුතු

ආන්තික සැපයුම්කරුවන් යනු වෙළෙඳ ආයතන ගනුදෙනුකරුවන්ට ලබා දී ඇති වෙළෙඳ ණය අය කිරීම සහ ණය මිල දී ගැනීම (factoring) සිදු කරනු ලබන ආයතන ය. සාධ්‍යකරණ ආයතන ලෙස ද මේවා හඳුන්වයි.

# ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම් (Venture Capital Companies)

නව ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර සඳහා ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් කටයුතු කරන ආයතන විශේෂයකි. නව ව්‍යාපාර ආරම්භ කිරීම, පවතින ව්‍යාපාර ව්‍යාප්ත කිරීම, ව්‍යාපාර පවරා ගැනීම හා මිල දී ගැනීම වැනි කටයුතු වලදී අරමුදල් සපයයි. මීට අමතර ව කොටස් ප්‍රාරක්ෂණය හා ණය සම්මේලය කිරීම ආදියෙහිද යෙදේ.

නිදසුන් : සෙන්ට්‍රල් ෆිනෑන්ස් වෙන්චර් ඇන්ඩ් ලිමිටඩ් ලංකා වෙන්චර්ස් ලිමිටඩ් එන්ඩීබී වෙන්චර් ඉන්වෙස්ට්මන්ට් (පෞද්.) සමාගම

# ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන

## රක්ෂණ සමාගම් (Insurance Companies)

**රක්ෂණ සමාගම්වල විවිධ රක්ෂණ ඔප්පු නිකුත් කිරීම මගින් ගොඩනැගෙන අරමුදල් මූල්‍ය වෙළෙඳපොළ ණය දීම හා ආයෝජනය කිරීම මගින් මූල්‍ය අතරමැදිකරණයක නිරත වන ආයතන වේ.**

**නිදසුන් : සීමා සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සීමාසහිත සෙලින්කෝ රක්ෂණ සමාගම සීමාසහිත ජනශක්ති රක්ෂණ සමාගම**

## සේවක අර්ථසාධක අරමුදල

සේවක අර්ථසාධක අරමුදල ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය සඳහා පවතින විශාලතම විශ්‍රාම අරමුදල වන මෙය කම්කරු කොමසාරිස්වරයා විසින් පරිපාලනය කරනු ලබයි.

අරමුදල කළමනාකරණය කිරීමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ.

## සේවා නියුක්තිකයිනගේ භාර අරමුදල

රාජ්‍ය කළමනාකාරිත්ව යෙන් යුත් අරමුදල් සේවා නියුක්තිකයිනගේ භාර අරමුදල - මෙය ප්‍රතිපත්ති සම්පාදන,ආර්ථික කටයුතු, ළමා හා තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මගින් පරිපාලනය කෙරේ.

# රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල මෙම අරමුදල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් කළමනාකරණය කරනු ලබයි.

# අනුමත විශ්‍රාම හා අර්ථසාධක අරමුදල්

පෞද්ගලික කළමනාකාරිත්වයෙන් යුත් අරමුදල් අනුමත විශ්‍රාම හා අර්ථසාධක අරමුදල් කම්කරු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

# ශ්‍රී ලංකා මහ බැංකුව

1949 අංක 58 දරණ මුදල් නීති පනත යටතේ 1950 අගෝස්තු මස 28 වෙනි දින ආරම්භ කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුව ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ නියෝජිතයකු ලෙස ක්‍රියා කරනු ලබන කේන්ද්‍රීය ආයතනය වේ.

එහි ආරම්භක අධිපතිවරයා වූයේ ජෝන් එක්ස්ටර් මහතා ය.

පස් දෙනෙකුගෙන් සමන්විත මුදල් මණ්ඩලයක් මගින් මහ බැංකුවේ සංවිධාන කටයුතු සිදු කෙරෙන අතර, එම මුදල් මණ්ඩලය, මහ බැංකු අධිපති, මුදල් විෂය භාර අමාත්‍යාංශ ලේකම් හා පත්කළ සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වේ.

# ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රධාන අරමුණු දෙකක් පෙරදැරිව කටයුතු කරයි.

## ආර්ථික හා මිල ස්ථායිතාව පවත්වා ගෙන යාම

දේශීය මුදලේ අගය ස්ථාවර ව පවත්වා ගැනීම හෙවත් සුරක්ෂිත කිරීම මිල ස්ථායීතාව වේ. මේ තුළින් උද්ධමන හා අවධමන තත්ත්වයන්ගෙන් තොර ව ආර්ථිකය පවත්වා ගැනීම අපේක්ෂා කෙරේ. උද්ධමනය අඩු මට්ටමක පවතින විට ආර්ථිකය හොඳින් ක්‍රියාත්මක වේ. තිරසර ආර්ථික වර්ධනයක් හා ඉහළ සේවා නියුක්තියක් ඇති කිරීමට මෙය ඉවහල් වේ.

# මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව පවත්වා ගෙන යාම

ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ලෙස හැඳින්වේ. එනම් මූල්‍ය පද්ධතියේ සුරක්ෂිතතාව ඇති කිරීම, ස්ථායීතාවට එල්ල විය හැකි තර්ජන හඳුනා ගැනීම සහ ඒවා අවම කිරීම තුළින් මූල්‍ය ක්‍රමය ශක්තිමත් කිරීමේ හැකියාව ඇත. මෙ මගින් තැන්පත්කරුවන්ට හා ආයෝජකයින්ට යන දෙපාර්ශ්වයට ම හිතකර වාතාවරණයක් උදා කෙරේ.

## ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා පහත කාර්යයන්හි නියැලේ.

-  මහ බැංකුවේ ප්‍රධාන කාර්යයන්
-  මුදල් ප්‍රතිපත්ති මෙහෙය වීම
-  විනිමය අනුපාතික ප්‍රතිපත්ති මෙහෙය වීම
-  ශ්‍රී ලංකාවේ නිල විදේශ සංචිත කළමනාකරණය
-  ව්‍යවහාර මුදල් නිකුත් කිරීම හා බෙදා හැරීම
-  බැංකු හා බැංකු නො වන ආයතනවල අධීක්ෂක ලෙස කටයුතු කිරීම
-  රජයේ ආර්ථික උපදේශක, බැංකුකරු සහ මූල්‍ය නියෝජිතයා වශයෙන් කටයුතු කිරීම
-  මහ බැංකුවේ පියවීම් ගිණුම් පවත්වා ගෙන යන වාණිජ බැංකුවලට හා ප්‍රාථමික වෙළෙඳුන්ට නිෂ්කාශන සහ පියවීමේ පහසුකම් සැපයීම

# මහ බැංකුවේ නියෝජ්‍යායතන කාර්යයන්

- රාජ්‍ය ණය කළමනාකරණය
- විදේශ විනිමය පාලනය
- කුඩා පරිමාණ මූල්‍යකරණ වැඩසටහන් සඳහා ග්‍රාමීය ණය යෝජනා ක්‍රම පිළිබඳ මූලික ආයතනය ලෙස කටයුතු කිරීම
- සේවක අර්ථ සාධක අරමුදල කළමනාකරණය

ව්‍යාපාරවල සාර්ථකත්වයට මහ බැංකුවේ කටයුතු ඉවහල් වන ආකාරය පහත පරිදි පැහැදිලි කළ හැකි ය.

# ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය - ia,smaia (Sri Lanka Inter - Bank Payment System - SLIPS)

පරිගණක භාවිත කරමින් බැංකු අතර සිදු වන ගනුදෙනු පියවීම සඳහා භාවිත කරනු ලබන ක්‍රමයකි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වා ගෙන යනු ලැබූ මෙම අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය, ශ්‍රී ලංකා මහ බැංකුවට හා වාණිජ බැංකුවලට හවුල් අයිතියක් ඇති සීමා සහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම වෙත පවරා දෙන ලදී.

සීමාසහිත ලංකා ක්ලියර් (පෞද්.) සමාගම විසින් පහත නිෂ්කාශන සේවා ඉටු කරයි.

- චෙක්පත් හා අණකර හුවමාරුව හා ශුද්ධ ශේෂය ගණනය කිරීම
- එම ශුද්ධ ශේෂ මහ බැංකුව හා අනෙකුත් වාණිජ බැංකු වෙත දැනුම් දීම

ලංකා ක්ලියර් පුද්ගලික සමාගම විසින් ：ලංකාපේ： (Lankapay)යන සන්නම් නාමය යටතේ ගනුදෙනු සඳහා පොදු කාඩ්පතක් හඳුන්වා දී ඇත.

ජගත් අන්තර්බැංකු මූල්‍ය විද්‍යුත් සන්නිවේදන ජාලය - ස්විෆ්ට් සන්නිවේදන ජාලය - (SWIFT - Sri Lanka Worldwide Inter Bank Financial Telecommuncaition )

නවීනතම තාක්ෂණය මත පදනම් වූ ලොව පුරා මූල්‍ය වෙළෙඳපොළවල් ආවරණය කෙරෙන සන්නිවේදන ජාලයකි. මෙ මගින් ජාත්‍යන්තර වශයෙන් බැංකු අතර සිදු වන මුදල් පැවරුම් පිළිබඳ ව කටයුතු කරයි.

# තත්කාලීන දළ පියවීම් පද්ධතිය - (RTGS - Real Time Gross Settlement system)

ශ්‍රී ලංකාවේ බැංකු අතර වටිනාකම් අධික ගෙවීම් කාල පමාවකින් තොර ව උසස් තාක්ෂණය හා ප්‍රමිතීන් යොදා ගනිමින් පියවීම සඳහා පිහිටුවා ඇති පරිගණක ගෙවුම් ක්‍රමයයි. ඉතා සුළු කාලයකින් පියවිය හැකි විම නිසා මෙම ක්‍රමය වැදගත් වේ. මෙය රට තුළ ඇති එක ම විශාල වටිනාකම් සහිත ජාතික ගෙවීම් පද්ධතියයි.

## ලේඛන රහිත සුරැකුම් තැන්පතු පද්ධතිය - (SSDS - Scriptless Securites Depository System)

මුද්‍රණය කරන ලද සුරැකුම්පත් සහතික භාවිතය වෙනුවට සුරැකුම්පත් මිල දී ගැනීමට හෝ විකිණීමට අදාළ ගනුදෙනුවක් කිරීම සඳහා ලේඛන රහිතව භාවිත වන ක්‍රමයයි. මෙය ලංකා සෙක්‍යුු (Secure) යන නමින් ද හඳුන්වයි මුද්‍රිත සුරැකුම්පත් ළඟ තබා ගැනීමේ දී හා විකිණීමේ දී ආයෝජකයාට දැරීමට සිදු වන අවදානම මෙ මගින් අහෝසි වේ.

ඉහත පද්ධති දෙක එක් ව ගත් විට ලංකා සෙට්ල් පද්ධතිය ලෙස හඳුන්වයි. (RTGS + SSDS = Lanka settle system )

# වාණිජ බැංකු

වාණිජ බැංකු සපයන ප්‍රධාන සේවාවන් දෙකකි.

-  තැන්පතු ආශ්‍රිත සේවා
-  ණය ආශ්‍රිත සේවා

## තැන්පතු ආශ්‍රිත සේවා :

ජංගම ගිණුම් (ඉල්ලුම් තැන්පතු), ඉතිරි කිරීමේ තැන්පතු හා ස්ථාවර තැන්පතු පවත්වා ගෙන යාම වාණිජ බැංකු විසින් පවත්වා ගෙන යන තැන්පතු ආශ්‍රිත සේවා වේ.

### ජංගම ගිණුම් (ඉල්ලුම් තැන්පතු): (Current Accounts)

චෙක්පත් මගින් ගනුදෙනු කිරීමේ  පහසුකම් ඇති, ශේෂය මත පොළී හිමි නොවන ගිණුම් වර්ගයකි  බැංකු අයිරා පහසුකම් සැලසෙන අතර ටෙලර්පත් භාවිතයෙන් ගනුදෙනු කළ හැකි ය.

## ඉතිරි කිරීමේ තැන්පතු (Savings Accounts )

ඉතිරි කිරීමේ පරමාර්ථයෙන් හඳුන්වා දී ඇති මෙම ගිණුම් වර්ගයට ශේෂය මත පොළියක් හිමි වේ. තැන්පත්කරුගේ අභිමතය පරිදි මුදල් තැන්පත් කිරීම හා ආපසු ගැනීම කළ හැකි ය. ටෙලර්පත් මගින් ද ගනුදෙනු කළ හැකිය.

## ස්ථාවර තැන්පතුඃ (Fixed Deposits )

නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා නිශ්චිත මුදල් ප්‍රමාණයක්, නිශ්චිත පොළියක් යටතේ තැන්පත් කිරීමකි. ඉතිරි කිරීමේ තැන්පතු වලට සාපේක්ෂව ඉහළ පොළියක් හිමිවේ.

**ඉහත තැන්පතු වර්ග අතුරෙන් ජංගම ගිණුම් පවත්වාගෙන යාමෙන් ව්‍යාපාරිකයන්ට ලබා ගත හැකි පහසුකම් කිහිපයක් පහත දැක්වේ.**

- චෙක්පත් මගින් ගෙවීම් කළ හැකි වීම
- ප්‍රේෂණ පහසුකම් ලබා ගත හැකි වීම
- නිත්‍ය නියෝග මත ගෙවීම් කළ හැකි වීම
- අයිරා පහසුකම් ලබා ගත හැකි වීම
- බැංකුව සමග කළ ගනුදෙනුවල වාර්තාවක් ලබා ගත හැකි වීම (බැංකු ගිණුම් ප්‍රකාශය )

# ණය ආශ්‍රිත සේවා :

- අයිරා පහසුකම්

- ණය

  - ව්‍යාපාරික ණය

  - පාරිභෝගික ණය

# අයිරා පහසුකම්

බැංකු අයිරා පහසුකම් යනු  බැංකු ජංගම ගිණුමේ ඇති ශේෂය ඉක්මවා කිසියම් නිශ්චිත  මුදල් ප්‍රමාණයක් දක්වා චෙක්පත් නිකුත් කිරීමට වාණිජ බැංකු මගින් ලබා දෙන අනුමැතියකි.

මේවා තාවකාලික අයිරා පහසුකම් හා ස්ථාවර අයිරා පහසුකම් ලෙස වර්ග දෙකකි.

අයිරා පහසුකමක් දී ඇති විටක  එම ප්‍රමාණය දක්වා ගනුදෙනුකරුවන්ගේ චෙක්පත් ගෙවීම බැංකු විසින් කරනු ලැබේ. එසේ ජංගම ගිණුම්හිමියා (ගනුදෙනුකරු) ජංගම ගිණුමේ ශේෂය ඉක්මවා නිකුත් කරන ලද චෙක්පත්වල වටිනාකම බැංකු අයිරාව ලෙස හැඳින්වේ. අයිරා සඳහා සාමාන්‍යයෙන් ඉහළ පොළියක් අය කෙරේ.

## ස්ථාවර අයිරා පහසුකම්

ස්ථාවර අයිරා පහසුකම් යනු අඛණ්ඩව කිසියම් අයිරා පහසුකමක් ලබා දීමයි. ස්ථාවර අයිරා ලබා ගැනීමේදී  වත්කම් ඇප තැබීම අවශ්‍ය වේ.

## තාවකාලික අයිරා පහසුකම්

තාවකාලික අයිරා පහසුකම් යනු ස්ථාවර අයිරාවක් නොමැතිව ශේෂයට වඩා චෙක්පත් නිකුත් වී ඇති විට බැංකුව ඒ සඳහා මුදල් ගෙවීමයි.

## බැංකු ණය

බැංකු ණය යනු කිසියම් පොළී ප්‍රතිශතයක් යටතේ ලබා ගන්නා ණය මුදල හා ඊට අදාළ පොළිය ආපසු ගෙවීමට යටත්ව ගිවිසගත් කොන්දේසි යටතේ බැංකුවක් විසින් දෙනු ලබන මුදලකි.

# බැංකු ණය වර්ග දෙකකි.

## ව්‍යාපාරික ණය

ව්‍යාපාරික ණය යනු පුද්ගලයෙකුට හෝ ආයතනයකට තම ව්‍යාපාරික කටයුතු සඳහා කෙටි කාලීනව, මධ්‍ය කාලීනව හා දිගු කාලීනව අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම වේ.

## පාරිභෝගික ණය

පාරිභෝගික ණය යනු වත්කම් මිලට ගැනීමට හා හදිසි ආපදාවල දී පිරිමසා ගැනීමට පාරිභෝගිකයින්ට බැංකුව විසින් සපයන ණය වේ.

බැංකු අයිරා පහසුකම් ලබා ගැනීමට ජංගම ගිණුමක් අත්‍යවශ්‍ය වන අතර බැංකු ණය ලබා ගැනීමට ජංගම ගිණුමක් අවශ්‍ය නොවේ.

**තැන්පතු භාර ගැනීම හා ණය සැපයීමට අමතරව වාණිජ බැංකු විසින් ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට බලපාන පහත සඳහන් සේවාද සපයනු ලබයි.**

## නියෝජිත සේවා :

**වාණිජ බැංකු විසින් ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවල දී ගනුදෙනුකරුවන් වෙනුවෙන් නියෝජිතයෙකු ලෙස කටයුතු කරයි.**

නිදසුන් :

- සුරැකුම්පත් මිලයට ගැනීම හා විකිණීම
- ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම
- විදුලි බිල්පත් හා ජල බිල්පත් ගෙවීම

-  කල්බදු සේවා

-  විද්‍යුත් බැංකු සේවා ( E- Banking)

අන්තර්ජාලය හරහා බැංකු කටයුතු සිදු කර ගැනීම සඳහා ගනුදෙනුකරුවන්ට සපයා ඇති පහසුකම විද්‍යුත් බැංකු සේවා ලෙස හඳුන්වයි. එවැනි පහසුකම් කිහිපයක් පහත දැක්වේ.

**හෝම් බෑංකින් : ( Home Banking)**

තම පෞද්ගලික පරිගණකය මගින් අන්තර්ජාලය හරහා බැංකුවේ වෙබ් අඩවියට පිවිස රහස් අංකය භාවිත කොට ස්වයංක්‍රීයව බැංකු පහසුකම් ලබා ගැනීම මෙහි අදහසයි.

**දුරකථන බැංකු සේවා (Tele Banking)**

ගනුදෙනුකරු බැංකුව වෙත නොගොස් තම දුරකථනය භාවිත කිරීමෙන් වාණිජ බැංකු කටයුතු සිදු කර ගැනීමයි.

##  උකස් සේවා :

ස්වර්ණාභරණ ඇපයට ගෙන හදිසි මුදල් අවශ්‍යතා සඳහා ණය ලබා දීම වාණිජ බැංකු විසින් සිදු කරන වැදගත් සේවාවකි.

##  සුරක්ෂිතාගාර පහසුකම් :

පුද්ගලයින්ගේ රන්, රිදී, මුතු, මැණික් ආභරණ, ඔප්පු වැනි වටිනා භාණ්ඩ හා වැදගත් ලියවිලි ආරක්ෂා කර දීම වාණිජ බැංකු විසින් සිදු කරයි. මේ සඳහා වාණිජ බැංකුවල විශේෂිත සේප්පු වෙන් කර ඇත.

##  විදේශ විනිමය මිල දී ගැනීම හා විකිණීම

විනිමය පාලන නියමයන් යටතේ ගනුදෙනුකරුවන්ගේ විදේශ මුදල් මිලට ගැනීමත් ඔවුන්ට අවශ්‍ය විදේශ මුදල් විකිණීමත් වාණිජ බැංකු විසින් සිදු කරයි

## ණයපත් සේවාව :

කිසියම් නිශ්චිත වටිනාකමක් දක්වා අනුමත ආයතනවලින් භාණ්ඩ හා සේවා ලබා ගැනීමට හැකි වන පරිදි වාණිජ බැංකු හෝ බලයලත් ආයතන විසින් නිකුත් කරන කාඩ්පත් විශේෂයකි. ණයපත් මගින් යම් සීමාවක් දක්වා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර භාවිතයෙන් මුදල් ලබා ගැනීමේ හැකියාව ද ඇත

නිදසුන් :

- වීසා කාඩ්
- මාස්ටර් කාඩ්
- ඇමරිකන් එක්ස්ප්‍රස් කාඩ්

##  මුදල් ප්‍රේෂණ කටයුතු :

ගිණුම් හිමියා වෙනුවෙන් ඔහුට ලැබීමට ඇති මුදල් ඔහුගේ ගිණුමට රැස් කිරීම මින් අදහස් වේ. විදේශයක සිටින පුද්ගලයෙකුට මුදල් පැවරීම මෙන්ම, විදේශයක සිටින පුද්ගලයින්ගෙන් ලැබෙන මුදල් රැස් කිරීමද මේ යටතේ සිදු කෙරේ.

## සංචාරක චෙක්පත් නිකුත් කිරීම :

දේශීය හා විදේශීය සංචාරකයින්ගේ ගනුදෙනු පහසුවෙන් හා ආරක්ෂාකාරීව සිදු කිරීම සඳහා භාවිත කෙරෙන චෙක්පත් විශේෂයකි. සංචාරක චෙක්පත් , පොදුවේ පිළිගන්නා මුදල් වර්ගවලින්, විවිධ වටිනාකම් යටතේ නිකුත් කරයි. තමන් සතු මුදල් බැංකුවට ලබා දී එම වටිනාකමට බැංකුවෙන් සංචාරක චෙක්පත් ලබා ගන්නා අතර, සංචාරයේ යෙදෙන අතරතුර දී එම ප්‍රදේශයේ වාණිජ බැංකුවකට එම සංරචක චෙක්පත් ලබාදී නැවත මුදල් ලබා ගැනීමට හැකියාව ඇත. නිකුත් කිරීමේ දී බැංකුව විසින් සේවා ගාස්තුවක් අය කරනු ලබයි.

## ස්වයංක්‍රීය බැංකු සේවා :

බැංකු ගිණුම් හිමියන්ට තම බැංකුවෙන් ලබා දී ඇති පහසුකම් බොහොමයක් බැංකුවට නොගොස් දවසේ ඕනෑම වේලාවක ලබා ගැනීමට හැකිවනසේ හඳුන්වා දී ඇති විද්‍යුත් අරමුදල් හුවමාරු ක්‍රමයක.

මෙමගින් ගනුදෙනුකරුවන්ට බැංකු වලින් පහත සේවා ලබා ගත හැකිය.

## ස්වයංක්‍රීය බැංකු සේවා නිසා ගනුදෙනුකරුවන්ට අත්වන වාසි :

- ටෙලර් කාඩ්පත් භාවිතයෙන් ගිණුමෙන් මුදල් ආපසු ගැනීම
- ගිණුමට මුදල් තැන්පත් කිරීම
- ගිණුමකින් ගිණුමකට මුදල් මාරු කිරීම
- ගිණුමේ ශේෂය දැන ගත හැකි වීම
- බිල්පත් ගෙවීමේ පහසුකම් තිබීම

## ස්වයංක්‍රීය බැංකු සේවා නිසා බැංකුවලට අත්වන වාසි :

- පිරිවැය අඩු වීම
- තදබදය අඩු වීම
- නිරවද්‍යතාව ඉහළ වීම
- කාර්ය මණ්ඩලය අඩු කර ගත හැකි වීම
- බැංකු සේවා පුළුල් වී බැංකුවල ලාභදායිත්වය වැඩි වීම

- ණයවර ලිපි නිකුත් කිරීම

ආනයනකරුගේ ඉල්ලීම මත ආනයනකරුගේ බැංකුව විසින් ආනයනකරු වෙනුවෙන් මුදල් ගෙවන බවට එකග වෙමින් අපනයනකරුගේ බැංකුව වෙත ඉදිරිපත් කරන ලියවිල්ල ණයවර ලිපියයි.

- වෙනත් සේවා :

උදා :

- රක්ෂණ සේවා

- වාණිජ බැංකු විසින් රක්ෂණ සමාගමක් සමග සම්බන්ධ වී තම බැංකුවේ
- ගිණුම් හිමියන් රක්ෂණය කිරීම

- වෛද්‍ය සේවා සැපයීම (E- channalling - E- Billing)
- ජනාකීර්ණ ස්ථානවල 'ඔඑ යන්ත්‍ර ස්ථාපිත කර තිබීම
- චෙක්පත් හා මුදල් තැන්පත් කිරීම සඳහාම සුවිශේෂීවූ ATM යන්ත්‍ර ස්ථාපිත කර තිබීම

# චෙක්පත්

ජංගම ගිණුම් හිමියකු (අණකරු) විසින් එහි සඳහන් මුදල නම සඳහන් පුද්ගලයාට (ආදායකයාට) හෝ රැගෙන එන අයෙකුට ගෙවන ලෙස බැංකුවට (අණලදුට) කරනු ලබන ලිඛිත නියෝගය චෙක්පතක් ලෙස හැඳින්වේ.


## චෙක්පතකට සම්බන්ධ ප්‍රධාන පාර්ශ්ව :

අණකරු (**Drawer** ) - ගිණුම් හිමියා

අණලදු (**Drawee**) - ගිණුම පවත්වා ගෙන යන වාණිජ බැංකුව

ආදායකයා (**Payee** ) - චෙක්පතෙහි නම සඳහන් පුද්ගලයා, චෙක්පතෙහි සඳහන් මුදල ලැබීමට හිමිකම ලබන්නා

# චෙක්පතක මූලික ලක්ෂණ




1. දිනය 2. බැංකුවේ නම හා ශාඛාවේ නම 3. ආදායකයාගේ නම 4. හෝ රැගෙන එන්නාට යන යෙදුම 5. චෙක්පතේ වටිනාකම අකුරෙන් හා ඉල්කමෙන් 6. ගෙවනු යන පදය 7. අණකරුගේ අත්සන 8. චුම්භක අක්ෂර හැඳුනුම් තීරය (මෙහි පිළිවෙලින් චෙක්පත් අංකය, බැංකුවේ අංකය, ශාඛාවේ අංකය හා ගිණුම් අංකය සඳහන් වේ ) 9. චෙක්පතේ පිළිපත

## ප්‍රධාන වශයෙන් චෙක්පත් වර්ග දෙකකි

### ධාරක චෙක්පත් (භාරක චෙක්පත් ) (Bearer cheques)

චෙක්පතෙහි මුද්‍රිතව ඇති ..හෝ රැගෙන එන්නාට.. යන පදය කපා නොහැර ඇති චෙක්පතකි. පිටසන් කිරීමකින් තොර ව හුදු භාර දීමෙන් ධාරක චෙක්පත පැවරිය හැකි අතර බොහෝ දුරට මුදල් නෝට්ටුවකින් ගනුදෙනු කිරීම හා සමාන වේ.

### විධාන චෙක්පත් (Order cheques )

හෝ රැගෙන එන්නාට යන පදය කපා හැර හෝ ඒ වෙනුවට ..විධානයට.. යන්න ලියා ඇති චෙක්පත් වේ. මෙවැනි චෙක්පතක් පැවරීමේ දී පිටසන් කිරීම අවශ්‍ය වේ. ධාරක චෙක්පතකට වඩා විධාන චෙක්පත්වල ආරක්ෂාව වැඩිය.

## චෙක්පතක් ලිවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු කිහිපයක් පහත දක්වේ.

- ලිවීමේ දී නො මැකෙන තීන්ත වර්ගයක් භාවිත කළ යුතුය.
- පිළිපතේ අදාළ විස්තර සටහන් කළ යුතුය.
- ලිවීමේ දී සිදු වන වැරදි තනි ඉරකින් කපා අණකරුගේ සම්පූර්ණ අත්සන යෙදිය යුතුය.
- එක ම භාෂා මාධ්‍යයක් භාවිත කළ යුතුය.
- අණකරුගේ අත්සන නියමාකාරයෙන් යෙදිය යුතුය.
- චෙක්පතකට යොදන දිනය හා එහි ආරක්ෂාව සඳහා ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳ ව සැලකිලිමත් විය යුතුය.
- හිස් චෙක්පතකට අත්සන් නො යෙදිය යුතුය.

# චෙක්පත් රේඛනය : (Crossing the cheques)

චෙක්පතක මුහුණත හරහා සමාන්තර රේඛා දෙකක් ඇඳීම හෝ වාණිජ බැංකුවක නමක් සඳහන් කිරීම චෙක්පත් රේඛනය කිරීම ලෙස හඳුන්වයි. චෙක්පතකට සම්බන්ධ ඕනෑම පාර්ශ්වයකට රේඛනයක් සිදු කළ හැකි අතර, යොදන ලද රේඛනයක් අවලංගු කළ හැක්කේ චෙක්පතේ අණකරුට පමණි.

## චෙක්පත් රේඛනයේ අවශ්‍යතාව :


-  චෙක්පතට අමතර ආරක්ෂාවක් සැලසීම
-  චෙක්පතෙහි  සඳහන් වටිනාකම එහි ආදායකයාට ලැබීම සහතික කිරීම
-  බැංකු කවුන්ටරයෙන් මුදල් ලබා ගැනීම වැළැක්වීම

# රේඛන වර්ග දෙකකි.

- සාමාන්‍ය රේඛනය
- විශේෂ රේඛනය


## සාමාන්‍ය රේඛනය (General crossing)

වගන්ති සහිතව හෝ රහිතව චෙක්පතේ මුහුණත හරහා සරල සමාන්තර රේඛා දෙකක් ඇඳීම සාමාන්‍ය රේඛනය ලෙස හැඳින්වේ.



# විශේෂ රේඛනය (Special crossing )

සරල සමාන්තර රේඛා දෙකක් සහිතව හෝ රහිතව චෙක්පතක මුහුණත හරහා **වාණිජ බැංකුවක නමක්** සඳහන් කිරීම විශේෂ රේඛනය වේ. මෙවැනි චෙක්පත්, රේඛනයේ නම සඳහන් බැංකුවේ ගිණුමක තැන්පත් කළ යුතුය.



චෙක්පතක රේඛනය තුළ ..ගනුදෙනු කළ නොහැකිය .. යන පදය යෙදීමෙන් අදහස් වන්නේ මෙවැනි චෙක්පතක් පිටසන් කර පැවරිය හැකි බවත්; එම චෙක්පත පැවරීමේ දී පැවරුම්කරුට තිබූ අයිතියට වඩා වැඩි අයිතියක් පැවරුම්ලාභියාට හිමි නොවන බවත්ය. එම නිසා මෙවැනි රේඛනයක් යෙදූ චෙක්පතක් ලබා ගැනීමේ දී පැවරුම්ලාභියා එම චෙක්පතට පෙර තිබූ අයිතීන් පිළිබඳ සැලකිලිමත් විය යුතු බව ඇඟවේ.

චෙක්පතක රේඛනය තුළ .. ආදායකයාගේ ගිණුමට පමණයි .. යන පදය යෙදීමෙන් අදහස් වන්නේ චෙක්පතෙහි නම සඳහන් ආදායකයාගේ ගිණුමට තැන්පත් කිරීමෙන් පමණක් මුදල් කර ගත හැකි බවයි. මෙය පැවරීම සීමා කෙරෙන රේඛනයකි.

චෙක්පතක රේඛනය තුළ .. රු. 5 000 ක් දක්වා පමණයි .. යනුවෙන් මුදල් සීමාවක් යෙදීමෙන් අදහස් වන්නේ සඳහන්ව ඇති මුදල් ප්‍රමාණයට වඩා වැඩියෙන් චෙක්පතේ වටිනාකම සඳහන් නො විය යුතු බවයි.

# චෙක්පත පිටසන් කිරිම (Endorsement)

චෙකප් තෙහි  මුහුණත සඳහන් වන ආකාරයටම ආදායකයා සිය  නම චෙක්පතෙහි පිටුපස ලිවීම චෙක්පත පිටසන් කිරීම ලෙස හැඳින්වේ. (චෙක්පත දරන ඕනෑ ම අයෙකු චෙක්පත පැවරීමේ  දී  ඔහුගේ  නම  ලිවිය  යුතු ය. ) චෙක්පත නීත්‍යානුකූල ව පැවරූ බව සනාථ කිරීම පිටසන මගින් සිදු වේ.

## පිටසන යෙදීම අවශ්‍ය වන අවස්ථා

- ආදායකයා විසින් චෙක්පත බැංකුවෙහි තැන්පත් කිරීමේ දී
- විධාන චෙක්පතක් නම් අන් අයෙකුට පවරන අවස්ථාවේ දී
- රේඛනය  නො කරන ලද චෙක්පත් බැංකු කවුන්ටරයට දී මුදල් ලබා ගැනීමේ දී

# චෙක්පත් අගරු වීම (Dishonour of cheques )

ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කළ චෙක්පතකට මුදල් ගෙවීම බැංකුව විසින් ප්‍රතික්ෂේප කිරීම චෙක්පතක් අගරු වීම ලෙස හැඳින්වේ.

## චෙක්පතක් අගරු වන අවස්ථා :

-  ගිණුමේ ප්‍රමාණවත් මුදල් නො මැති වීම
-  අණකරු විසින් ගෙවීම නතර කර තිබීම
-  අණකරු බුන්වත් වීම
-  අණකරු මරණයට පත්වීම හා ඒ බව බැංකුවට දනුම් දී තිබීම
-  ගානිෂි නියෝගයක් ලැබීම (උසාවි නියෝගයක් )
-  ලිඛිත වැරදි
-  ගිණුම වසා තිබීම

## විද්‍යුත් මුදල් (E - money)

විද්‍යුත් ක්‍රමයට නැතහොත් පරිගණක ජාලයක් හරහා හුවමාරු වන මුදල් විද්‍යුත් මුදල් ලෙස සැලකේ.

එහි ප්‍රතිඵලයක් වශයෙන් එක් පාර්ශ්වයකින් තවත් පාර්ශ්වයකට අරමුදල් මාරුවීමක් සිදුවේ. **(Electronic Fund Transfer )**

# ණයපත්

කිසියම් නිශ්චිත වටිනාකමක් දක්වා අනුමත වෙළෙඳ ආයතනවලින් භාණ්ඩ හා සේවා ලබා ගැනීමට හැකි වන පරිදි වාණිජ බැංකුවක් හෝ බලයලත් ආයතනයක් විසින් නිකුත් කරනු ලබන කාඩ්පත් විශේෂය ණයපත් ලෙස හඳුන්වයි.

ව්‍යාපාරිකයෙකුට ණයපතක් ඉදිරිපත් කළ විට එහි වලංගුභාවය සහ ණය සීමාව පරීක්ෂා කිරීමට විද්‍යුත් සත්‍යාපන ක්‍රම ( **Electronic verification systems** ) යොදා ගැනේ ව්‍යාපාරයේ ඇති යන්ත්‍රයට ණයපත ඇතුළත් කළ විට එම තොරතුරු ලබා ගත හැකිය.

නමුත් විද්‍යුත් වාණිජ්‍යයේ දී ණයපත ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන අතර අන්තර්ජාලය හරහා ණයපතෙහි තොරතුරු පමණක් ඉදිරිපත් කිරීමෙන් ගණුදෙනුව සිදු කළ හැකිය.

උදා :

සී බෑන්ක් වීසා - ලංකා බැංකුව

පීපල්ස් වීසා - මහජන බැංකුව

මාස්ටර් කාඩ් - සම්පත් බැංකුව

සෙලාන් වීසා - සෙලාන් බැංකුව

## ණයපත් මගින් ගනුදෙනු කිරීමේ වාසි හා අවාසි

### ගනුදෙනුකරුවන්ට අත්වන වාසි

- ණයපතක් ලබා ගැනීම සඳහා ගිණුමක් තිබීම අවශ්‍ය නො වීම
- යම් කාලසීමාවක් දක්වා පොලී රහිත ණයක් වීම
- අනුමත සීමාව තුළ **ATM** යන්ත්‍ර මගින් මුදල් ලබා ගත හැකි වීම
- වට්ටම් හා ප්‍රසාද ලකුණු හිමි වීම

## ගනුදෙනුකරුවන්ට අත්වන අවාසි

- ණයපත සඳහා මුදල් ගෙවීම ප්‍රමාද වීමෙන් දඩ මුදලක් ගෙවීමට සිදු වීම
- සෑම අලෙවිසැලකින් ම ගනුදෙනු සිදු කළ නො හැකි වීම

## ව්‍යාපාරිකයාට අත්වන වාසි

- ණයට විකුණුම් සඳහා මුදල් ලැබීම ස්ථිර වීම
- පිරිවැටුම වැඩි වීම නිසා ලාභය වැඩි වීම
- නොමිලේ ප්‍රචාරණයක් ලැබීම

## ව්‍යාපාරිකයාට අත්වන අවාසි

- බැංකුවට කොමිස් මුදලක් ගෙවීමට සිදු වීම
- විශේෂිත යන්ත්‍රයක් ස්ථාපිත කිරීමට සිදු වීම

## හරපත්

බැංකු ගිණුම් හිමියෙකුට, තම ගිණුමේ ඇති මුදල් වෙළෙඳසැල් ගෙවීම් පියවීමට පැවරීම සඳහාත්, ටෙලර් යන්ත්‍ර භාවිතයෙන් මුදල් ආපසු ලබා ගැනීම සඳහාත් බැංකුව විසින් නිකුත් කරනු ලබන ප්ලාස්ටික් කාඩ්පත් විශේෂයකි.

ගිණුමේ ඇති ශේෂය සඳහා පමණක් හරපත් හිමියාට ගනුදෙනු සිදු කළ හැකි ය.

**නිදසුන්**

**SET සම්පත් බැංකුව**

**PET මහජන බැංකුව**

**Catsupper කොමර්ෂල් බැංකුව**

## හරපත් මගින් ගනුදෙනු කිරීමෙන් ගනුදෙනුකරුවන්ට අත්වන වාසි

- ගිණුමේ ඇති මුදල් භාවිත කරන නිසා පොළියක් ගෙවිය යුතු නො වීම
- ගනුදෙනුව එම අවස්ථාවේම නිම වීම
- **ATM** යන්ත්‍ර හරහා මුදල් ලබා ගැනීම ද කළ හැකි වීම

## හරපත් මගින් ගනුදෙනු කිරීමෙන් ගනුදෙනුකරුවන්ට අත්වන අවාසි

- ගිණුමක් තිබීම අනිවාර්ය වීම
- ගිණුමේ ඇති ශේෂය දක්වා පමණක් ගනුදෙනු සිදු කළ හැකි වීම

## පෙර ගෙවුම් කාඩ්පත්


කලින් මුදල් ගෙවා ලබා ගත හැකි කාඩ්පත් විශේෂයකි. මුදල් හෝ චෙක්පත් වෙනුවට ආරක්ෂාකාරී මෙන් ම පහසු විද්‍යුත් ගෙවීම් ක්‍රමයකි. බැංකු ගිණුම් නොමැති අයට පවා පෙර ගෙවුම් කාඩ්පත් භාවිතය මගින් විද්‍යුත් ක්‍රමයට ගෙවීම් කළ හැකි ය.

නිදසුන් : දුරකථන කාඩ්පත් Travell pass

# ස්මාර්ට් කාඩ්පත්

මෙය **integrated circuit card** එකකි. මෙහි මුදල් වටිනාකමක් සහිත **chip** එකක් අන්තර්ගතය. මෙය භාවිත කර ගනුදෙනුවක් සිදු කළ විට එම ගනුදෙනුවේ වටිනාකම හර වී ශේෂය අඩු වේ. අදාළ නිකුතු ආයතනයට මුදල් ගෙවා වරින් වර මුදල් ගබඩා කර **(Re-Loard)** ගත හැකි ය. ස්මාර්ට් කාඩ්පත මගින් ණයපතක, හරපතක, **ATM** කාඩ්පතක කාර්යයන් ද සිදු කළ හැකි අතර මෙය විද්‍යුත් මුදල් පසුම්බියක් **(E-purse)** ලෙස භාවිත කළ හැකි ය.






01නිකුත් කරන ආයතනයේ නම හා ලාංඡනය

02 කාඩ්පත් වර්ගය නිදසුන් ( **(Debit card, Credit card , ATM card )**

03කාඩ්පත් අංකය

04සන්නම් ලාංඡනය **(Brand Lago)** නිදසුන් : **VISA , Master**

05කල් ඉකුත් වන දිනය

06කාඩ්පත් හිමියාගේ නම

07කාන්දම් පටිය **(Magnetic stripe)** □ අත්සන් පටියී **(ignature stripe)**

08කාඩ්පත් ආරක්ෂිත සංකේතය **( card security code )**

09ත්‍රිමාන චිත්‍රය **(Holo gram)**

10නිකුතු ආයතනයේ නම , ලිපිනය හා කොන්දේසි

11ගනුදෙනුකරු සේවා දුරකථන අංකය : **(customer service hotline)**

# විද්‍යුත් මුදලින් ගනුදෙනු පියවීමේ දී පහත සඳහන් පාර්ශ්ව සම්බන්ධ වේ.

- කාඩ්පත් හිමියා
- කාඩ්පත් නිකුත් කරන ආයතනය
- වෙළෙන්දා හෙවත් විකුණුම්කරු
- ණයපත් සංගමය නිදසුන් : වීසා, මාස්ටර්, ඇමරිකන් එක්ස්ප්‍රස් (AMEX)

## විද්‍යුත් මුදලින් ගනුදෙනු කිරීමේ වාසි හා අවාසි කිහිපයක් පහත දැක්වේ.

### වාසි :

- ගනුදෙනු කිරීමේ දී පිරිවැය අඩු වීම
- මුදලේ ආරක්ෂාව තහවුරු වීම
- දවසේ පැය 24 පුරාම ගනුදෙනු කළ හැකි වීම
- ගෙවීම් කටයුතු පහසු වීම
- විවිධ ප්‍රතිලාභ හිමි වීම
- විදේශ ගනුදෙනු සඳහා ද භාවිත කළ හැකි වීම

## අවාසි :

- පොළී, ප්‍රමාද ගාස්තු වැනි පිරිවැය කිරීමට සිදු වීම
- වංචනික ක්‍රියා සිදු වීම
- අනවශ්‍ය පරිභෝජන රටාවකට හුරු වීම
- තාක්ෂණික දෝෂ නිසා ගනුදෙනුවලට බාධා සිදු වීම
- සියලුම ගනුදෙනුකරුවන්ට ගනුදෙනු කිරීමට හැකියාවක් හා ශක්තියක් නො මැති වීම

A/L NOTE BOOK

All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

www.ALNoteBook.com

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

“The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements.”